# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,937/4 — 1970 දෙසැම්බර් 21 වැනි සඳුද — 1970.12.21**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත**

**අංක 2611 දරණ පැවරුම් නියෝගය**

ගා/ශාන්ත ඇලෝසියස් විද්‍යාලය, ගාල්ල

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බද්උද්දීන් මහමුද් වන මම 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, මීට යාකොට දක්වෙන උපලේඛනයෙහි විශේෂ කොට දක්වා ඇත්තාවූද, පවරාගනු ලැබිය හැකි වූද, දේපොල සියල්ලම 1971 වර්ෂයේ ජනවාරි මාසයේ 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රජයට පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

**උප ලේඛනය**

1960 ජුලි මස 21 වන දින ඉහත කී ගා/ශාන්ත ඇලෝසියස් විද්‍යාලය පැවැත්වූවාවූත්, නඩත්තු කරනු ලැබුවාවූත්, දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතරේ, ගාලු නගර සීමාව තුළ පිහිටි පෝරක ගොඩැල්ල වත්ත නොහොත් ලිදමුල වත්ත නමැති ඉඩමෙන් වරිපනම් අංක 14 සහ 16 දරණ,

උතුරට : පෝරක ගොඩැල්ල වත්තේ, රාස මරික්කාර් සම්සි ලෙබ්බෙ මරික්කාර් මහතා ට අයිති කැබෙල්ලෙන් ද,

නැගෙණහිරට : ගා/මවුන්ට් කැල්වරි–කතෝලික සිංහල පාසල් භූමියෙන් සහ සාන්ත මේරි දේවස්ථානයට යන පටු ප්‍රවේශ මාර්ගයෙන් ද,

දකුණට : ටෙම්ප්ලර්ස් පාර සහ සාන්ත මේරි දේවස්ථානයට යන පටු ප්‍රවේශ මාර්ගයේ කොටසකින් ද,

බටහිරට : ටෙම්ප්ලර්ස් පටු මගින් ද, මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටක් (අ. 0 රූ. 1 පර්. 28) පමණ වූ ඉඩම් කැබෙල්ල සහ දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතරේ, ගාලු නගර සීමාව තුළ පිහිටි පෝරකගොඩැල්ල වත්ත නොහොත්, ලිදමුල වත්ත නමැති ඉඩමෙන් වරිපනම් අංක 10 දරණ කැබෙල්ලෙන්

උතුරට : ශාන්ත මේරි දේවස්ථානයට යන පටු ප්‍රවේශ මාර්ගය සහ බදු වත්තෙන් ද,

නැගෙණහිරට : පෝරක ගොඩැල්ල වත්තේ ශාන්ත මේරි කැතිඩ්‍රල් දේවස්ථානය පිහිටි භූමිය සහ පල්ලියේ සුසාන භූමියට සහ පෞද්ගලික පාර සහ පූජක නිවාස භූමියෙන් ද,

දකුණට : ටෙම්ප්ලර්ස් පාර සහ පල්ලිය සතු භූමියෙන් ද,

බටහිරට : ටෙම්ප්ලර්ස් පාරෙන් ද, මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකක් පමණ වූ (අ.1 රූ. 1 පර්. 0) ඉඩම් කැබැල්ල සම්පූර්ණයෙන්, සහ දේවස්ථානයට උතුරෙන් පිහිටි අඩි 75 × 17 දිග පලල ඇති ගොඩනැගිල්ලේ මායිම් වන

උතුරට : ඉහත සඳහන් ගොඩනැගිල්ලේ උතුරු බිත්තියට අඩි 2½ උතුරෙන් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

නැගෙනහිරට : එම ගොඩනැගිල්ලේ නැගෙණහිර බිත්තියට අඩි 2½ ක් නැගෙණහිරෙන් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

දකුණට : එකී ගොඩනැගිල්ලේ දකුණු බිත්තියට අඩි 2½ ක් දකුණෙන් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

බටහිරට : බදුවත්ත නමැති ඉඩමෙන් ද, මායිම් වූ ඉඩම් කොටස සහ ඉහත සඳහන් ගොඩනැගිල්ලට ආසන්නව පිහිටා ඇති අඩි 26 × 17½ දිග පළල ඇති ගොඩනැගිල්ලේ මායිම් වන

උතුරට : එම ගොඩනැගිල්ලේ උතුරු බිත්තියට අඩි 2½ උතුරෙන් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

නැගෙණහිරට : එම ගොඩනැගිල්ලේ නැගෙණහිර බිත්තියට අඩි 2½ ක් නැගෙණහිරෙන් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

දකුණට : එම ගොඩනැගිල්ලේ දකුණු බිත්තියට අඩි 2½ ක් දකුණින් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

බස්නාහිරට : එම ගොඩනැගිල්ලේ බස්නාහිර බිත්තියට අඩි 2½ ක් බස්නාහිරෙන් ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද, මායිම් වූ ඉඩම් කොටස් සහ මෙම නියෝගයෙන් පවරා ගනු ලබන සෑම දේපොල වලටම දනට යාම් ඊම් සඳහා ඇති සෑම ප්‍රවේශ මාර්ගයකින්ම යාම් ඊමේ සම්පූර්ණ අයිතිය ද ඇතිව, විද්‍යාලයීය ලිඳෙන් වතුර ලබා ගැනීමේ අයිතිය පූජකවරුන්ට දෙමිනි.

2. පාසල් ශිෂ්‍ය නිවාස ගොඩනැගිල්ලේ තුන්වන මාලයේ පිහිටි පූජක භොජනාගාරය, එම මුළුතැන් ගෙය, පුස්තකාලය සහ දේව මන්දිරය හැර මෙම උපලේඛනයේ 1 වැනි ඡෙදයේ සඳහන් වන ඉඩම් කැබලිවල තනවා ඇති සියලුම ගොඩනැගිලි සහ නිර්මාණයක් ද සම්පූර්ණයෙනි.

3. ඉහත සඳහන් ගා/ශාන්ත ඇලෝසියස් විද්‍යාලය පවත්වා ගෙන යෑමට හා නඩත්තු කිරීම සඳහා, ජාතික අධ්‍යාපන පරීක්ෂණ වාර්තාවේ සහ ඉහත සඳහන් විද්‍යාලය පවත්වා ගෙන යෑම සඳහා නඩත්තු කරනු ලැබුවා වූ සියලුම ඉන්වැන්ට්‍රි සහ අනිකුත් ලිපි ලේඛන ආදියෙහි සඳහන් වන සියලුම චංචල දේපල සම්පූර්ණයෙනි.

952/5——ජේ 19903—11,075 (70/12)

4. ඉහත සඳහන් විද්‍යාලයට අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හෝ එම විද්‍යාලයේ අයිතිකරුගෙන් ෙ අයිතිකරුවන්ගෙන් හෝ වෙනත් අයකුගෙන් හෝ අයවලුන්ගෙන් හෝ ආධාර, ගාස්තු, දීමනා සහ පරිත්‍යාග හෝ පිරිනැමීම යන අන්දමින් අයවිය යු හිමිවිය යුතු සියලුම මිල මුදල් ඇතුළත් ය.

බද්දිඋද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

1970 දෙසැම්බර් මස 18 වැනි දින
කොළඹ 2,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

12–1049/1

---

## 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### අංක 2612 දරණ පවරා ගැනීමේ නියෝගය

### ත්‍රි/ශාන්ත ජෝශප් විද්‍යාලය, ත්‍රිකුණාමලය

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බදිඋද්දීන් මහමුද් වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වැ වගන්තිය යටතේ මාවෙත පැවරී ඇති බලතල අනුව, 1971 ජනවාරි 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, මෙහි පහත සඳහන් උප ලේඛනයේ විශේෂයෙ දක්වෙන පවරා ගැනීමට යටත් සියලු දේපල, රජයට පැවරෙන බව මේ නියෝගයෙන් ප්‍රකාශ කරමි.

#### උප ලේඛනය

1. 1960 ජුලි මස 21 වැනි දින ත්‍රිකුණාමලේ ත්‍රි/ශාන්ත ජෝශප් විද්‍යාලය පවත්වා නඩත්තු කරන ලද ස්ථානය, එනම් : නැගෙනහිර පලාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ත්‍රිකුණාමලය නගරයේ පිහිටා ඇති,

වයඹදෙසට : ත්‍රිකුණාමලේ ජේසු සභාවේ පූජකවරුන්ට අයත් ඉඩමෙන්ද,

ඊසාන දෙසට : විදුලි බලගාර පාරෙන් හා ත්‍රිකුණාමලේ ජේසු සභාවේ පූජකවරුන්ගේ ඉඩමෙන්ද,

ගිනිකොණ දෙසට : ත්‍රිකුණාමලේ වාරිමාර්ග නිවාස වලින්ද,

නිරිත දෙසට : ත්‍රිකුණාමලේ ජේසු සභාවේ පූජකවරුන්ට අයත් ඉඩමෙන්ද, මායිම් වූ අක්කර 2ක් විශාල වූ බිම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උප ලේඛනයේ 1 වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන්ව ඇති ඉඩම් කොටස තුළ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම ද,

3. ඉහත කී විද්‍යාලය හා එම විද්‍යාලය වෙනුවෙන් තබා ඇති වාර්තා හා බඩු ලේඛන වලින් ජාතික අධ්‍යාපන සමීක්ෂණ ආකෘති පත්‍රවල ප්‍රකාශිත එම විද්‍යාලය පවත්වා නඩත්තු කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලුම චංචල දේපල ද,

4. අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගේ එකී පාසැලට ආධාර මුදල් වශයෙන් ලැබිය යුතු පාසැල සතු සියලුම මුදල් ද, ඉහතකී විද්‍යාලය වෙනුවෙන් එ විද්‍යාලයේ අයිතිකරු හෝ වෙනයම් තැනැත්තෙක් හෝ තැනැත්තන් විසින් හෝ තබා ගන්නා ලද විද්‍යාලය නමින් පවත්නා වෙනත් සියලු ආධාර මුදල්. ගාස්තු, ත්‍යාග හා පරිත්‍යාග මුදල් ආදී විද්‍යාලයට අයත් සියලුම මුදල් ද ඇතුළත් ය.

බදිඋද්දීන් මහමුද්,
අධ්‍යාපන අමාත්‍ය.

පාප/9/1323,
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
70.12.18.

12–1049/2

---

## 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### අංක 2613 දරණ පවරා ගැනීමේ නියෝගය

### මඩ/ශාන්ත මයිකල් විද්‍යාලය, මඩකලපුව

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බද්උද්දින් මහමුද් වන මම 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, 1971 ජනවාරි 15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි මෙහි පහත සඳහන් උප ලේඛනයේ විශේෂයෙන් දක්වෙන පවරා ගැනීමට යටත් සියලුම දේපල රජයට පැවරෙන බව මේ නියෝගයෙන් ප්‍රකාශ කරමි.

#### උප ලේඛනය

1960 ජුලි මස 21 වැනි දින මඩකලපුවේ ශාන්ත මයිකල් විද්‍යාලය පවත්වා නඩත්තු කරන ලද ස්ථානය, එනම් : නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනයි ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පුලියන්තිවු නමැති ගමේ පිහිටි මඩකලපුවේ අප්ස්ටෙයා රෝඩ් හි 1ඒ දරණ ස්ථානයේ බලය ලත් මිනින්දෝරු සහ මට්ටම්කරු ඇස්. ඇස්. සෙල්වරත්නම් මහතා විසින් සාදන ලද 70.7.9 වැනි දින සහ අංක 135 දරණ පිඹුරේ ප්‍රකාර 3 සිට 6 දක්වා වූ බිම් කැබලිවල අඩංගු ඉඩම් කොටස සහ 1 සහ 7 යන බිම් කැබලි වලින් කොටස් වන,

උතුරෙන් : ශාන්ත මේරි පාරෙන් සහ අංක 1 දරණ බිම් කැබැල්ලේ ඉතිරි කොටසින්ද, අංක 2 දරණ බිම් කැබැල්ලේ ඉතිරි කොටසින් ද,

නැගෙනහිරින් : සැන්ට්‍රල් පාරෙන්ද,

දකුණෙන් : දේවස්ථානය සතු දේපල සහ අංක 7 දරණ බිම් කැබැල්ලේ ඉතිරි කොටසින් ද,

බස්නාහිරින් : දෙවැනි හරස් වීදියෙන්ද මායිම් වූ අක්කර දෙක හමාරක් (දළ වශයෙන්) විශාල වූ බිම් කොටස සම්පූර්ණයෙනි. ගේට්ටුව, අඩි පාරවල් සහ පළමුවැනි මහලට පිවිසෙන තරප්පු පෙළ පාවිච්චි කිරීමේ අයිතිය ඇතිව උතුරු හා නැගෙනහිර ගොඩනැගිලිවල සම්පූර්ණ උඩු මහලේ කොටස් හැර.

2. මෙම උපලේඛනයේ 1 වැනි ඡේදයෙන් වෙසෙසා දක්වෙන ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

3. ඉහත කී විද්‍යාලය හා එම විද්‍යාලය වෙනුවෙන් තබා ඇති වාර්තා හා බඩු ලේඛන වලින් ජාතික අධ්‍යාපන සමීක්ෂණ ආකෘති පත්‍රවල ප්‍රකාශිත එම විද්‍යාලය පවත්වා නඩත්තු කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලුම චංචල දේපල.

4. අධ්‍යාපන අධ්‍යක්ෂ වර්යාගෙන් එකී පාසැලට ආධාර මුදලක් වශයෙන් ලැබිය යුතු පාසැල සතු සියලුම මුදල්ද, ඉහත කී විද්‍යාලය වෙනුවෙන් එම විද්‍යාලයේ අයිතිකරු හෝ වෙනයම් තැනැත්තෙක් හෝ තැනැත්තන් විසින් හෝ තබා ගන්නා ලද විද්‍යාලය නමින් පවත්නා වෙනත් සියලු ආධාර මුදල් ගාස්තු, ත්‍යාග හා පරිත්‍යාග මුදල් ආදී විද්‍යාලයට අයත් සියලුම මුදල්.

බදියුද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

පාප /9/1322,
අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2,
1970.12.18.

12–1049/3

---

## 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

### ක/මහවාද්දුව බෞද්ධ සිංහල මිශ්‍ර පාසැල, වාද්දුව

1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බදියුද්දීන් මහමුද් වන මම, 1962 මැයි මස 21 වැනි දින අංක 13,125 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1293 දරණ පැවරුම් ආඥාව, මීට යාකොට ඇති උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් දේපලට අදාල වනතාක් දුරට 1962 ජූනි මස 15 වැනි දින සිටබල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

බදියුද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

1970 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

### උප ලේඛනය

ක/මහවාද්දුව බෞද්ධ සිංහළ මිශ්‍ර පාසලේ, එනම්, බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මහවාද්දුව පිහිටි බිසෝකන්ද වත්ත හා ලෙල්ගහ වත්ත නොහොත් පුහුහෙරළිගහ වත්ත යන ඉඩමේ—

උතුරට : පාසලේ ස්ථිර ගොඩනැගිල්ලේ උතුරු බිත්තියේ සිට අඩි පණහක් (50ක්) උතුරෙන් එම බිත්තියට සමාන්තරව බස්නාහිර සිට නැගෙණහිරට විහිදෙන රේඛාවකින් ද,

දකුණට : පාසලේ ස්ථිර ගොඩනැගිල්ලේ උතුරු බිත්තියේ සිට අඩි විස්සක් (20ක්) උතුරෙන් එම බිත්තියට සමාන්තරව බස්නාහිරට සිට නැගෙණහිරට විහිදෙන රේඛාවකින් ද,

නැගෙණහිරට : ගංගාරාම විහාරයට යන බොරළු පාරෙන් ද,

බස්නාහිරට : ජාලිස් පෙරේරා මහතාට අයිති ඉඩමෙන් ද මායිම් වන බිම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උප ලේඛණයේ 1 වැනි ඡේදයේ නියමිත වශයෙන් දක්වා ඇති ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

2–1049/4

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි